# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


මගේ අංකය : **PE/24/2015**
எனது இல.

ඔබේ අංකය :
உமது இல.

දිනය : 2015.07.03
திகதி

චක්‍රලේඛ අංක TR/2015/06

තේරීම් භාර නිලධාරී / දිස්ත්‍රික් ලේකම්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,

**පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17**
**කුලී පදනම මත වාහන ලබාගැනීම හා ගෙවීම් කිරීම.**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේදී ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා හැකි පමණ රජයේ වාහන යොදා ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

02. ඡන්ද පොළවල් වෙත යවනු ලබන කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා හැකිතාක් දුරට රජයේ වාහන ද ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ හා පෞද්ගලික බස්රථ ද යොදා ගත යුතුය. තවද ඔබගේ අනුමැතිය සහිතව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එන පුද්ගලික වාහන ද මේ සඳහා යොදා ගත හැකිය. එහෙත් මෙම සියළු වාහන ද ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීමට සහ කලාප තේරීම්භාර නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා පමණක් කුලී ගෙවීම් පදනම මත ඔබගේ දිස්ත්‍රික්කය තුලින් පෞද්ගලික වාහන ලබා ගැනීමට කටයුතු කළ හැකිය. මෙසේ ලබා ගන්නා වාහන පූර්ණ රක්ෂණය සහිත වාහන විය යුතු වුවද අවශ්‍යතාවය මත තුන්වන පාර්ශවීය රක්ෂණය සහිත වාහන ද යොදා ගත හැකිය. එහෙත් කිසියම් අනතුරකදී හෝ අලාභයකදී මැතිවරණ දෙපාර්තමේන්තුව ඊට කිසිසේත් මැදිහත් නොවන බවට ඔවුන්ව ලිඛිතව දැනුවත් කළයුතු වේ. ඊට ඔවුන්ගේ ලිඛිත එකඟතාවය ද ලබාගත යුතුය.

03. ඔබ විසින් ලබා ගන්නා කුලී වාහන සඳහා පහත සඳහන් සංශෝධිත ගාස්තු යටතේ ගෙවීම් කළ හැකිය.

| කි.මී.1 ක් සඳහා අනුමත ගාස්තු | | |
|---|---|---|
| වාහන වර්ගය | පෙට්‍රල් වාහන | ඩීසල් වාහන |
| ආසන 08 අඩු කැබ් / වෑන් / ජීප් / කාර් | රු.44.00 | රු.37.00 |
| ආසන 08-14 ත් අතර වෑන් | රු.50.00 | රු.42.00 |
| ආසන 15-25 අතර | රු.58.00 | රු.48.00 |
| ආසන 26-39 අතර | - | රු.56.00 |
| ආසන 40 හෝ ඊට වැඩි | - | රු.66.00 |

මෙසේ ලබාගන්නා වාහන සඳහා ඉහත සඳහන් ගාස්තු වලට අමතරව තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ වේලාවේ සිට තේරීම්භාර නිලධාරී විසින් වාහනය මුදාහල වේලාව දක්වා වූ කාලසීමාවට පහත සඳහන් පරිදි රඳවා ගැනීමේ ගාස්තුවක් ගෙවිය හැක.

ආසන 08 ට අඩු වාහන සඳහා පැයට (කැබ් / වෑන් / ජීප්) - රු.20.00
ආසන 08 ට හෝ ඊට වැඩි වාහන සඳහා පැයට - රු.30.00

04. තවද කුලී පදනම මත සේවයේ යොදවාගනු ලබන වාහන වලට එම වාහන නවතා තබා ගැනීමේ ස්ථානයේ සිට දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ගේ කාර්යාලය වෙත වාර්තා කිරීමට හා මුදා හැරීමෙන් පසු ආපසු රැගෙන යාම සඳහා ද දිස්ත්‍රික්කය තුළ ධාවනය කිරීමට සිදුවන කිලෝමීටර් ගණන ද මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කර තිබිය යුතුය.

05. කුළියට ලබාගත් වාහන තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කිරීමෙන් අනතුරුව ගතවූ මුළු කාලය තුලදී යටත් පිරිසෙයින් කි.මී.50 ක් හෝ ධාවනය නොවූ අවස්ථාවකදී එම වාහන සඳහා කි.මී.50 ක් සඳහා වූ අවම ගාස්තුවක් ගෙවිය හැකිය. එහෙත් වාහනය කාර්මික දෝශයක් හෝ වෙනත් හේතුවක් නිසා ධාවනය කළ නොහැකි වී නම්, එම වාහන සඳහා කිසිදු ගාස්තුවක් නොගෙවිය යුතුය.

06. ඡන්ද පොළ නිලධාරීන් ප්‍රවාහනය සහ කලාප තේරීම්භාර නිලධාරීන් සඳහා හැර සුභ සාධක කටයුතු ආදී වෙනත් අවශ්‍යතා සඳහා කුලී වාහන යොදා නොගත යුතුය.

07. ඔබගේ අනුමැතිය සහිතව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් රැගෙන එන වාහන සඳහා ඉදිරියේදී නිකුත් කරනු ලබන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් අනුමත කර ඇති ගාස්තු ප්‍රමාණයන් යටතේ ද, කලාප තේරීම්භාර නිලධාරීන් රැගෙන එන වාහන සඳහා ආයතන සංග්‍රහයේ දැක්වෙන සීමාවන්ට අනුව සැතපුම් කුලී ගෙවීම ද සිදුකරනු ලබන බවද ඔවුනට දැනුම් දෙන්න. (එම ගෙවීම් සඳහා මෙම චක්‍රලේඛ අදාළ නොවේ.)

08. කුලී වාහන ලබා ගැනීම, ධාවනයේ යෙදවීම හා ඒ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය /නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු අතර, මෙම වාහන සම්බන්ධ පහත දැක්වෙන තොරතුරු ලේඛනයක සටහන් කරවීමට ද කරුණාකර විධි විධාන යොදන්න.

I. වාහන අංකය
II. වාහනයට යොදන ඉන්ධන වර්ගය
III. අයිතිකරුගේ නම සහ ලිපිනය
IV. වාහනයේ ආසන ගණන
V. ඡන්ද විමසීමේ කටයුතු සඳහා වාර්තා කළ දිනය හා වේලාව
VI. මුදාහල දිනය හා වේලාව
VII. ධාවනය කල කිලෝමීටර් ගණන ( වාහන රැගෙන ඒම හා රැගෙන යාම සඳහා ධාවනය කළ යුතු කි.මී. ගණන ද ඇතුළුව)
VIII. ධාවනය සඳහා ගෙවූ මුදල
IX. රඳවා ගැනීමේ කාලය සඳහා ගෙවූ මුදල
X. සේවයේ යෙදවීම අනුමත කළ නිලධාරියාගේ නම අත්සන හා නිල නාමය

09. කුලී පදනම මත වාහනය ලබාගන්නා අවස්ථාවේදීම මෙම චක්‍රලේඛයට අනුකූලව ගෙවනු ලබන ගාස්තු දැක්වෙන ලිපියක් වාහන හිමියන්ට නිකුත් කරන්න. තවද ගෙවීම් කිරීම සඳහා බිල්පත් ඉදිරිපත් කළයුතු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නම හා ලිපිනය ද එම ලිපියේ අඩංගු කිරීමට කරුණාකර කටයුතු කරන්න.

10. ඡන්ද විමසීම අවසන්ව මාසයක් ඇතුලත ඔබ ලබාගන්නා කුලී වාහන වලට ගෙවීම් කටයුතු අවසන් කළයුතු අතර එසේ ගෙවීම් කටයුතු අවසන් වූ පසු ඉහත 08 වන ඡේදයේ සඳහන් ලේඛනය නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් භාරයේ තබා ගත යුතුය.

11. කුලී පදනම මත ලබාගන්නා වාහනවලට ගෙවීම් කරනුයේ අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් බවද එම ගෙවීම් වෙනත් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකට හෝ මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත හෝ ඉදිරිපත් නොකරන ලෙස ද ඔවුන්ට උපදෙස් දෙන්න.

12. තවද චක්‍රලේඛ අංක TR/2015/05 හි උපදෙස් අනුව පොලිස් දෙපාර්තමේන්තුවට හා ආරක්ෂක හමුදාවල අවශ්‍යතාවයන් සඳහා කුලියට ගනු ලබන වාහන සඳහා මෙම රේට්ටු යටතේ පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන තුලින් ගෙවීම් කළයුතු වේ. කෙසේ වෙතත් ලබා ගන්නා වාහන අදාළ මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කරවීම අනිවාර්ය බව පොලිස් අධිකාරිවරුන්ට දන්වා සිටින්න.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්

පිටපත්: 1. පොලිස්පති - මැතිවරණ කටයුතු සඳහා ඔබ දෙපාර්තමේන්තුවට අවශ්‍යවන පුද්ගලික කුලී වාහන චක්‍රලේඛ TR/2015/05 සහ මෙම චක්‍රලේඛයෙන් ලබාදී ඇති උපදෙස් හා ගාස්තු ප්‍රමාණයන් යටතේ ලබා ගැනීමට කටයුතු කළ හැක. ඒ සඳහා ගෙවීම් කළයුත්තේ ඔබගේ දෙපාර්තමේන්තුව වෙත වෙන්කර දෙනුලබන ප්‍රතිපාදන වලිනි.

2. විගණකාධිපති
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
4. ප්‍රධාන ගණකාධිකාරී
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)
6. ගණකාධිකාරී (ගෙවීම්)


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*

# ආදර්ශ අයදුම් පත්‍රය.

## පාර්ලිමේන්තු මැතිවරණය

## කුලී පදනම මත වාහන සැපයීම සඳහා ඉල්ලුම් කිරීම

I. වාහනයේ ලියාපදිංචි අංකය :

II. වාහනයේ 4 WD පහසුකම් සහිතද ? (ඔව් / නැත)* :

III. ඉන්ධන වර්ගය : පෙට්‍රල් / ඩීසල් *

IV. වාහනයේ මගී ආසන සංඛ්‍යාව :

V. වාහනය අයිතිකරුගේ :

- නම :
- ලිපිනය :
- ජාතික හැඳුනුම්පත් අංකය :

VI. රියදුරුගේ නම :

VII. රිය සහයකගේ නම :

(ආසන 26 ට වඩා වැඩි වාහන සඳහා පමණි)

VIII. වාහනය සමාන්‍යයෙන් නවත්වා තබන ස්ථානයේ ලිපිනය :

IX. ඉහත VIII හි සඳහන් ස්ථානයේ සිට තේරීම්භාර නිලධාරි කාර්යාලය වෙත ඇති දුර ප්‍රමාණය කි.මී.

X. වාහනය වෙනුවෙන් ලබා ඇති රක්ෂණ සහතිකයේ වලංගු කාලය :

(රක්ෂණ සහතිකයේ පිටපතක් අමුණන්න)

දිනය :- ..................................................

වාහනය අයිතිකරුගේ අත්සන

අයදුම්පත් එවිය යුතු ලිපිනය :

තේරීම් භාර නිලධාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (කච්චේරිය)

.................................................... (අදාළ දිස්ත්‍රික්කයේ නම)

* (අනවශ්‍ය වචන කපා හරින්න)